## 09. උපනිස්සය ප්‍රත්‍යයේ ත්‍රි රාශිය

උපනිස්සය ප්‍රත්‍යය ආරම්මණූපනිස්සය ප්‍රත්‍යය, අනන්තරූපනිස්සය ප්‍රත්‍යය, පකතූපනිස්සය ප්‍රත්‍යය යි තෙවැදෑරුම් වේ. එයින් ආරම්මණූපනිස්ස ප්‍රත්‍යයේ ත්‍රිරාශිය ආරම්මණාධිපති ප්‍රත්‍යයේ ත්‍රිරාශිය මෙනි. අනන්තරූපනිස්සය ප්‍රත්‍යයේ ත්‍රිරාශිය අනන්තරප්‍රත්‍යයේ ත්‍රිරාශිය මෙනි. පකතූපනිස්සය ප්‍රත්‍යයේ ත්‍රි රාශිය මෙසේ ය.

බලවත් වන්නා වූ පෙර පෙර එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපණස ය, රූප අටවිස්ස ය, ප්‍රත්‍යය වන්නා වූ ඇතැම් ප්‍රඥප්තීහු ය යන මොවුහු පකතූපනිස්සය ප්‍රත්‍යය ධර්මයෝ ය.

එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපණස ය යන මොවුහු පකතූපනිස්සය ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ය.

චිත්තජ රූපය, ප්‍රතිසන්ධි කර්මජ රූප ය, බාහිර රූප ය, ආහාරජ රූප ය, ඍතුජ රූප ය, අසංඥ සත්ත්ව කර්මජ රූප ය, ප්‍රවෘත්ති කර්මජ රූප ය යන මොවුහු පකතූපනිස්සය ප්‍රත්‍යයේ ප්‍රත්‍යනීක ධර්මයෝ ය.

---

**උපනිස්සය** - "උපායාසො - බලවත් වූ වෙහෙස" යන තැන ඇති 'උප' ශබ්දය මෙන් මෙම උපනිස්සය යන්නෙහි 'උප' ශබ්දය බලවත් යන අර්ථය ප්‍රකාශ කරයි. "භුසො+නිස්සයො උපනිස්සයො" භුසො-බලවත් වූ, නිස්සයො-නිශ්‍රය වන්නා වූ හේතුව, උපනිස්සයො - උපනිස්සය නම් වේ. මෙම විග්‍රහයට අනුකූලව "සාමාන්‍ය නොවන, නිශ්‍රය ශක්තියට වඩා බලවත් වූ නිශ්‍රය ශක්තිය උපනිස්සය යැයි කියනු ලබයි" යනුවෙන් දතයුතු වේ.

මෙම උපනිශ්‍රය ප්‍රත්‍යය මේඝයකට (වැස්සකට) උපමා කොට ඇත. වැසි ජලය ලැබීම හේතුවෙන් වර්ධනය වන වෘක්ෂයන්ට සහ සත්ත්වයන්ට එම වැසි ජලය බලවත් නිශ්‍රයක් වන්නාක් මෙන් ආරම්මණ, අනන්තර සහ පකත ධර්මයෝ ද තමන් සමඟ අදළ වන්නා වූ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්ගේ බලවත් නිශ්‍රය වේ ය යැයි අදහස් කෙරේ.

**නිස්සය හා උපනිස්සයේ වෙනස** - මූල ප්‍රකෘති වන්නා වූ පිහිටා සිටීමට උපකාරක වන ශක්තිය උපනිශ්‍රය යි. ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් පහළ වන අවස්ථාව පැමිණි විටදී වෙන්ව නොපැවැතිය හැකි හේතුව වන්නා වූ ආධාර ශක්තිය නිශ්‍රය යි. උපමාවකින් කිවහොත් - හැල්වලින් බතක් උපදනා විට හැල් වී බීජ, කුඹුර,

වර්ෂාව මූල උපකාරකය වන අතර බත් පිසින සැළිය, ගින්දර ආදිය බත පිසිනා අවස්ථාවේ දී වෙන්ව නොපැවැතිය හැකි හේතුව වන්නා වූ ආධාර ශක්තියෙන් උපකාර වන්නාක් මෙන් චක්ඛුවිඤ්ඤාණ විපාක සිත් පහළ වීමට මූල උපකාරක සඞ්ඛ්‍යාත කර්මය උපනිශ්‍රය වන අතර, චක්ෂු වස්තුවෙහි චක්ෂු විඤ්ඤාණය උපදින අවස්ථාවේදී වෙන්ව පැවැතිය නොහැකි හේතුව වන්නා වූ ආධාර ශක්තියෙන් චක්ඛු වස්තුව නිශ්‍රය වේ.

**ආරම්මණූපනිස්සය** - සාමාන්‍ය නොවන තදින් ඇද බැඳ තබාගත හැකි තරම් ලෝභනෙය්‍ය අරමුණු, ප්‍රීති පස්සද්ධිය පහළ කරවමින් මහත් වූ ශ්‍රද්ධාවක් ජනිත කරවීමට සමත් අරමුණු, ආරම්මණික සිත්වල පහළ වීමට බලවත් කාරණයක් වීම හේතුවෙන් ආරම්මණූපනිස්සය යන නම ලැබේ. මෙහි ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්නයෝ ආරම්මණාධිපති සමඟ සර්ව සමාන ය. ආරම්මණාධිපති සහ ආරම්මණූපනිස්සයේ ප්‍රත්‍ය ශක්තීන් අතර ඇති වෙනස නම් තමා හා සම්බන්ධ වන්නා වූ ආරම්මණික චිත්තෝත්පාදය අරමුණු නොකර සිටීමට නොහැකි වන තරම් ඇදගන්නා අධිපති ශක්තිය ආරම්මණාධිපති ශක්තිය නම් වේ. ආරම්මණික චිත්තෝත්පාදය පහළ වීමට බලවත් වන්නා වූ නිශ්‍රය භාවය ආරම්මණූපනිස්සය නම් වේ. (අටුවා- ගරුකාතබ්බමත්තට්ඨෙන ආරම්මණාධිපති, බලවකාරණට්ඨෙන ආරම්මණූපනිස්සයොති එවමෙතෙසං නානත්තං වෙදිතබ්බං)

**අනන්තරූපනිස්සය** - අනන්තර ප්‍රත්‍යය ධර්මයෝ ම පසු පසු සිත් පහළ වීම සඳහා බලවත් නිශ්‍රය හේතුව වන බැවින් අනන්තරූපනිස්සය යන නම ලැබේ. අනන්තර සහ අනන්තරූපනිස්සය ප්‍රත්‍ය ශක්තීන්ගේ වෙනස නම් තමාට අනතුරුව සුදුසු පරිදි චිත්තෝත්පාදයක් ජනිත කරවීමට හැකි ශක්තිය අනන්තර ශක්තිය යි. පසු පසු සිත් ඉපදීම සඳහා බලවත් වන්නා වූ නිශ්‍රය භාවය උපනිශ්‍රය (අනන්තරූපනිස්සය) ශක්තිය යි. මෙසේ වූ කල්හි පරමාර්ථ ධර්ම වශයෙන් මෙම දෙකෙහි වෙනසක් නැති වූයේ නමුදු ශක්ති විශේෂයන් පවතින බැවින් ඒ ශක්තියට අනුකූලව නාමය දක්වමින් වදාළ සේක.

**පකතූපනිස්සය** -"පකත+උපනිස්සය" යැයි ද, "පකති+උපනිස්සය" යැයි ද යන ක්‍රම දෙකින් පද බෙදත්. 'පකත' යන්නෙහි 'ප' ශබ්දය **භූසත්ත** - බලවත් යන අර්ථය ප්‍රකාශ කරයි. භූස සහ සුට්ඨු යන පද දෙකෙහි අර්ථය සමාන වේ. එබැවින් "සුට්ඨු කරීයිත්ථාති පකතො" යැයි විග්‍රහ කළ යුතු වේ. සුට්ඨු - මනාව, කරීයිත්ථ - කරනා ලදී, ඉති - එබැවින්, පකතො - පකත නම් වේ. ඒකාන්ත ඵල ධර්මයන් ඇති කරවීමට තරම් කරනා ලද්ද 'පකත - මනාව කරන ලද' යැයි කියයි. යමක් (යම් හේතුවක්) මනාව කරන ලද්දේ

වී නම් එහි ඵලය අනිවාර්යයෙන් ම ලැබේ. ස්වකීය සන්තානයෙහි පහළ කරගන්නා ලද යැයි කියන ලද **උප්පාදිතපකත** විශේෂය ද, අරමුණු කිරීම් වශයෙන් හෝ මුණගැසීම් හෝ උපභෝග ආදී වශයෙන් හෝ ඇති **උපසේවිතපකත** විශේෂය ද දෙවර්ගය ම 'කත' සඳහා ඇතුළත් වේ. "පකතො - මනාව කරනා ලද, උපනිස්සයො - බලවත් වූ නිශ්‍රය, පකතූපනිස්සයො - පකතූපනිස්සය නම් වේ."

**තවත් ක්‍රමයකින් -** "පකති + උපනිස්සය" ක්‍රමය. "පකතියායෙව - ප්‍රකෘති ස්වභාවයෙන් ම, උපනිස්සයො - බලවත් වූ නිශ්‍රය, පකතූපනිස්සයො". මෙම නය ක්‍රමයේදී ආරම්මණ සහ අනන්තර ශක්ති දෙක හා මිශ්‍ර නොවන ප්‍රකෘති ස්වභාවයෙන් ම බලවත් වන්නා වූ කාරණයෝ 'පකති' නම් වෙති. උදාහරණයකින් කිවහොත් - මුලින් ම ශ්‍රද්ධාව පහළ වී ඒ ශ්‍රද්ධාව ම පදනම් කරගෙන පසු පසු කුසලයෝ වැඩීමක් වන අවස්ථාවකදී, පෙර ශ්‍රද්ධාවෙහි ආරම්මණ සහ අනන්තර ශක්තිය නොමැත. ප්‍රකෘතියට ම අනුකූලව පසු පසු කුසල ධර්මයන් වැඩීමට බලවත් කාරණයක් වේ. එබැවින් පට්ඨාන අටුවාවේ දී "පකතියායෙව වා උපනිස්සයො පකතූපනිස්සයො, ආරම්මණානන්තරෙහි අසම්මිස්සොති අත්ථො" යැයි විස්තර කළහ.

මෙහි දී 'ආරම්මණ අනන්තර ස්වභාවයන් සමඟ කොහෙත් ම මිශ්‍ර නො වූ' යන අදහස නොගත යුතු. ආරම්මණ සහ අනන්තර ශක්තීන්ගේ මිශ්‍ර වීමක් නැත. ප්‍රකෘතියෙන් ම බලවත් වන්නා වූ කාරණයක් වේ නම්, ආරම්මණ අනන්තර ස්වභාවයන් හා මිශ්‍ර වීම ගැන කවර කතාවක් ද? යන අදහස ගත යුතු. එසේ ගැනීමෙන් "මාර්ග චේතනාව ඵලයට ප්‍රත්‍යය වන්නා වූ අවස්ථාවේ දී අනන්තරූපනිස්සය හා පකතූපනිස්සය යන දෙකම ලැබේ" යන වචනයට අනුකූල වේ.

**ප්‍රත්‍යය -** "බලවත් වන්නා වූ" යන වචනය චිත්ත චෛතසික රූප ප්‍රඥප්ති යන සියල්ල සමඟ සම්බන්ධ කරන්න. "බලවත් වන්නා වූ" යන වාක්‍ය ඛණ්ඩය උපනිස්සය යන්නෙහි 'උප' යන උපසර්ගය සඳහා කියන ලද්දකි. එබැවින් තමාව හේතු කොට ගෙන පසු අවස්ථාවක දී චිත්ත චෛතසිකයන් පහළ කරවීමට ඇති හැකියා මාත්‍රය 'බලවත් වන්නා වූ' යැයි නොකිය යුතු. සාමාන්‍ය පමණට වඩා වැඩි ශක්තියක් පැවතීමෙන් ම බලවත් වේ ය යැයි කිව යුතු වේ. උදාහරණයකින් කිවහොත් - බාධා නොකළ හැකි තරම් ශක්තියක් ඇති කර්මය, බාධා කළහොත් නිෂ්ප්‍රභා කළ හැකි කර්මය යනුවෙන් කර්ම වර්ග දෙකක් ඇත. දෙවැනි වර්ගය දුර්වල කර්මයකි. එය පකතූපනිස්සය සඳහා අදාළ නොවේ. ප්‍රථම

වර්ගය උපනිස්සය යන්නෙහි 'උප' සඳහා ලැබෙන 'බලවත්' යන වචනයට අනුකූල වේ.

"ප්‍රත්‍යය වන්නා වූ ඇතැම් ප්‍රඥප්තීහු ය" යන්නෙන් බොහෝ ප්‍රඥප්තීහු මෙම පකතූපනිස්සය සඳහා ඇතුළත් නොවේ. අසුභ ප්‍රඥප්ති, කොට්ඨාශ ප්‍රඥප්ති, කසිණ ප්‍රඥප්ති ආදිය පකතූපනිස්සය යැයි කීමක් නැත. පුද්ගල නම් වූ සත්ව ප්‍රඥප්තිය, වාසස්ථාන ආදිය "පුග්ගලො සෙනාසනං" ආදී වශයෙන් පකතූපනිස්සය යැයි කියවේ. එබැවින් "ඇතැම් ප්‍රඥප්තීහුය" වශයෙන් දැක්වීය. (ප්‍රත්‍යයෝත්පන්න සහ ප්‍රත්‍යනීක සුගම ය)

මෙම පකතූපනිස්සය ප්‍රත්‍යය අභිධර්මාර්ථ සංග්‍රහය ඇසුරෙන් දක්වන්නෙමි.

"රාගාදයො පන ධම්මා සද්ධාදයො ච සුඛං දුක්ඛං පුග්ගලො භොජනං උතුසෙනාසනඤ්ච යථාරහං අජ්ඣත්තඤ්ච බහිද්ධා ච කුසලාදිධම්මානං, කම්මං විපාකානන්ති ච බහුධා හොති පකතූපනිස්සයො" යන අභිධර්මාර්ථ සංග්‍රහ පාළිය යි. (රාගාදී ධර්මයෝ ද ශ්‍රද්ධාදීහු ද සුඛය ද දුඃඛය ද පුද්ගලයෝ ද භෝජනය ද ඍතුව ද සෙනසුන් ද සුදුසු පරිද්දෙන් ආධ්‍යාත්මික වූ ද බාහ්‍ය වූ ද කුශලාදි ධර්මයන්ට ද කර්ම විපාකයන්ට දැයි බහුප්‍රකාරයෙන් ප්‍රකෘත්‍යුපනිශ්‍රය ප්‍රත්‍යය වේ)

- "රාගාදයො-පෙ-සෙනාසනඤ්ච" යන කර්තෘ පාළියෙන් ප්‍රත්‍ය ධර්මයන් දක්වන අතර "කුසලාදිධම්මානං" යන සම්ප්‍රදාන පාළියෙන් ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් දැක්වේ. "කම්මං" යන කර්තෘ පාළියෙන් ප්‍රත්‍ය ධර්මයන් දක්වනු ලබන අතර "විපාකානං" යන සම්ප්‍රදාන පාළියෙන් ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් දැක්වේ.
- "යථාරහං අජ්ඣත්තඤ්ච බහිද්ධා ච" යන පාළිය කුසලාදී ධම්මානං පදය හා සම්බන්ධ කොට "රාගාදී ප්‍රත්‍යය ධර්මයෝ ස්වකීය සන්තානයෙහි පහළ වන කුසල ධර්ම, පර සන්තානයන්හි පහළ වන කුසලාදී ධර්මයන්ට සුදුසු පරිදි ප්‍රත්‍යය වේ" යන අදහස දතයුතු වේ. ඒ අතරින් "රාගාදයො" පාළියෙන් "රාගං උපනිස්සාය දෙසං, මොහං, දිට්ඨිං, පත්ථනං උපනිස්සාය දානං දෙති සීලං සමාදියති උපොසථකම්මං කරොති ඣානං උප්පාදෙති" ආදී පඤ්හාවාර පාළිය අපේක්ෂා කරයි.
- "සද්ධාදයො" පාළියෙන් "සද්ධං උපනිස්සාය -පෙ-සීලං සුතං චාගං පඤ්ඤං උපනිස්සාය මානං ජප්පෙති" ආදි

පාළිය අපේක්ෂා කරයි. එබැවින් සද්ධාදයො යන්නෙහි ආදි පදයෙන් සීල සුත චාග පඤ්ඤා සහ සියලු කුසල සුචරිතයන් ගතයුතු.

- "සුඛං දුක්ඛං පුග්ගලො භොජනං උතු සෙනාසනං" යන පදයෝ පාළියෙහි පැමිණෙන ප්‍රත්‍යයෝ වෙත්. මෙම " සුඛං දුක්ඛං" ආදියෙන් නිර්වාණය හැර සෙසු අබ්‍යාකත ධර්මයන් සහ ප්‍රත්‍යයන් සඳහා ලැබිය යුතු සෙසු ප්‍රඥප්තීන් ද ගැනීම අපේක්ෂා කෙරේ.

**රාගාදිය හේතුවෙන් කුසලාදී ධර්මයන් පහළ වීම** - මුලින්ම කාමගුණයෙහි මත් වන්නා වූ රාගයක් පහළ වේ, එම රාගය හේතුවෙන් කාමගුණයන් අනුභව කිරීම පිණිස දෙව්මිනිස් සැප ලැබීම සඳහා කුසල කර්මයන් සිදු කරනු ලබයි. එම රාගය සමනය කරගැනීමට හෝ අනවශේෂ වශයෙන් ප්‍රහාණය කරගැනීමට හෝ දාන, ශීල, සමථ, විදර්ශනා සිදු කරයි. එසේ සිදු කොට ධ්‍යාන, අභිඥා, මාර්ගඵල ලබාගනියි. එසේ සිදු කරන අවස්ථාවේ දී රාගය පකතූපනිස්සය ප්‍රත්‍යය වේ. ඉහතින් දැක්වූ කාමාවචර, මහද්ගත සහ ලෝකෝත්තර කුසලයෝ ප්‍රත්‍යයෝත්පන්න වෙත්. මුලින් ම රාගය පහළ වී ඒ රාගය හේතුවෙන් පසු පසු රාගයන් වැඩෙන අවස්ථාවක දී ඒ රාගය හේතුව වන අතර, වෛරී පුද්ගලයන් ඝාතනය කිරීම, සොරකම් කිරීම ආදිය සිදුකරන අවස්ථාවක දී මුලින් පහළ වූ රාගය පකතූපනිස්සය වේ. පසුව පහළ වන අකුසලයෝ ප්‍රත්‍යයෝත්පන්න වේ. ඒ රාගය හේතුවෙන් කුසලාකුසලයන්ගේ විපාක විඳින අවස්ථාවේ දී ද රාගය අනවශේෂ වශයෙන් ප්‍රහාණය කිරීම සඳහා මාර්ගය ඉපදවීමට උත්සාහ කොට ඵලසිත් ක්‍රියා සිත් උපදනා විට රාගය ප්‍රත්‍යය වේ. විපාක ක්‍රියා අබ්‍යාකතයෝ ප්‍රත්‍යයෝත්පන්නයෝ වෙත්. ස්වකීය සන්තානයේ පහළ වූ රාගය වෙනත් පුද්ගලයෙකු විසින් පිළිකුල් කරමින් කුසලයන් සිදුකරන අවස්ථාවක දී එසේ නොමැති නම් වෙනත් කෙනෙකුගේ රාගය දුන වෙනත් පුද්ගයෙකු විසින් රාග සිත් පහළ කරගන්නා අවස්ථාවේ දී, එසේ නොමැති නම් ඒ රාගය හේතු කොට ගෙන ඉෂ්ට අනිෂ්ට විපාක ක්‍රියා පහළ කරනා අවස්ථාවේදී ස්වකීය සන්තානයෙහි පහළ වූ රාගය බාහිර පුද්ගලයන්ගේ කුසල, අකුසල, අබ්‍යාකතයන්ට ප්‍රත්‍යය වේ. මෙසේ ඇති කල්හි රාගය ස්වකීය සන්තානයෙහි ද බාහිර සන්තානයන්හි ද කුසල අකුසල අබ්‍යාකතයන්ට පකතූපනිස්සය ශක්තියෙන් ප්‍රත්‍යය වේ. ද්වේෂාදිය ප්‍රත්‍යය වීම ද විස්තර කරගත යුතු වේ.

**ශ්‍රද්ධාදිය හේතුවෙන් කුසලාදී ධර්මයන් පහළ වීම** - මුලින් ම ශ්‍රද්ධාව පහළ වේ. ඒ ශ්‍රද්ධාව හේතුවෙන් දුන, ශීල ආදී මාර්ගය

දක්වා කුසලයන් වැඩීමට උත්සාහ කරයි. ශ්‍රද්ධාව පකතූපනිස්සය ප්‍රත්‍යය යි. දනාදී කුශලයෝ පකතූපනිස්සය ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. එම ශ්‍රද්ධාව හේතුවෙන් දනාදිය සිදු කරන අවස්ථාවක දී, අකුසලයන් පහළ වන අවස්ථාවක දී ශ්‍රද්ධාව ප්‍රත්‍යය වේ. අකුසලයෝ ප්‍රත්‍යයෝත්පන්නය වේ. ඒ ශ්‍රද්ධාව හේතුවෙන් කුසල අකුසලයන් පහළ වීමෙන් අනතුරුව ඊට අදළ වන විපාක ක්‍රියා ලබන අවස්ථාවේ දී ශ්‍රද්ධාව ප්‍රත්‍යය වේ. අබ්‍යාකත ධර්මයෝ ප්‍රත්‍යයෝත්පන්නයෝ වෙත්. ස්වකීය ශ්‍රද්ධාව හේතු කරගනිමින් අන්‍යයන්ට ප්‍රකාශ කිරීම හේතුවෙන් අන්‍යයන්ගේ සන්තානයෙහි ශ්‍රද්ධාව වැඩීම, එසේ ප්‍රකාශ කිරීමේ දී ඊර්ෂ්‍යාව පහළ වීම හේතුවෙන් අකුසලයන් වැඩෙන අවස්ථාවක දී, ඉෂ්ට අනිෂ්ට විපාකයන් ලබනා අවස්ථාවේ දී ස්වකීය ශ්‍රද්ධාව අන්‍යයන්ගේ කුසල අකුසල අබ්‍යාකතයන්ට පකතූපනිස්සය ශක්තියෙන් ප්‍රත්‍යය වේ. මෙසේ ඇති කල්හි ශ්‍රද්ධාව ස්වකීය සන්තානයෙහි ද අන්‍යයන්ගේ සන්තානයෙහි ද කුසල අකුසල අබ්‍යාකතයන්ට ප්‍රත්‍යය වේ. සීල ශ්‍රැත ආදිය ප්‍රත්‍යය වීම ද විස්තර කරගත යුතු වේ.

**සුඛාදිය හේතුවෙන් කුසලාදී ධර්මයන් පහළ වීම** - (සුඛ දුක්ඛ සඳහා කාය විඤ්ඤාණය හා සම්ප්‍රයුක්ත වන්නා වූ කායික සුඛ වේදනාව කායික දුක්ඛ වේදනාව උද්ධරණය කළ යුතු වේ.) කායික සුඛයක් ලබන අවස්ථාවේ දී ඒ සුඛය හේතු කරගෙන ඇතැමෙක් දිගින් දිගට ම සුඛය ලැබීම සඳහා දානසීලාදී කුසලයන් සිදු කරයි. ඇතැමෙක් සුවයන් අනුභව කරමින් අකුසලයන් වැඩි දියුණු කරති. ඒ කුසලාකුසලයන් සඳහා මෙලොව දී හෝ වේවා, පරලොව දී හෝ වේවා විපාක ලැබේ. එබැවින් ස්වකීය සුඛය ස්වකීය කුසල අකුසල අබ්‍යාකත පහළ වීමට ප්‍රත්‍යය වේ. එක් පුද්ගලයෙකු විඳින්නා වූ සුඛය දැක අසා වෙනත් පුද්ගලයෙක් කුසලාකුසලාදිය සිදු කරයි. දුක්ඛ වේදනාව විඳින අවස්ථාවක දී ඒ දුක්ඛයෙන් මිදීම සඳහා දනාදිය සිදුකරන අවස්ථාවක දී දුක්ඛය කුසලයන්ට ප්‍රත්‍යය වන අතර, දුක්ඛය නැති කරගැනීමට අකුසලයන් සිදු කරන අවස්ථාවක දී අකුසලයන්ට ද, ඵලයන් ගෙන දෙන අවස්ථාවේ දී අබ්‍යාකත ධර්මයන්ට ද ප්‍රත්‍යය වේ. එක් පුද්ගලයෙක් විඳින දුක පිළිබඳ දැක අසා කුසලාදිය සිදුකරන අවස්ථාවක දී ඒ පුද්ගලයාගේ දුක්ඛය අන් පුද්ගලයාගේ කුසලාදියට ප්‍රත්‍යය වේ.

**කල්‍යාණ මිත්‍රාදිය හේතුවෙන් කුසලාදී ධර්මයන් පහළ වීම** - කල්‍යාණ මිත්‍රයන් නිශ්‍රය කරගනිමින් කුසලයන් සිදු කරන අවස්ථාවේ දී, රහත් වීම සඳහා වීර්යය කොට අර්හත් ඵලය, ක්‍රියා ධ්‍යානයන් ලබන අවස්ථාවේ දී, බුද්ධ ශාසනය නිශ්‍රය කරගනිමින්

අසත්පුරුෂයන් විසින් කල්‍යාණ මිත්‍රයන් හේතුවෙන් අකුසලයන් සිදු කරන අවස්ථාවකදී, කල්‍යාණ මිත්‍රයා අන්‍ය පුද්ගලයන්ගේ සන්තානයෙහි කුසල අබ්‍යාකත අකුසලයන්ට ප්‍රත්‍යය වේ. අසත්පුරුෂයන් නිසා සංවේගය පහළකොට ගෙන කුසලයන් ද, විපාක ක්‍රියා අබ්‍යාකතයන් පහළ කරගැනීම ද, සත්ප්‍රාය ඍතු, භෝජන, සේනාසන ලැබීමෙන් ධර්ම මාර්ගය දියුණු කිරීමේ දී කුසල අබ්‍යාකතයන් වැඩීම ද, එම භෝජනාදිය ම ලැබීමෙන් අකුසලයන් වැඩීම ද විස්තර කරගත යුතු වේ.

"කම්මං විපාකානං - කර්ම විපාකයන්ට" යන්නෙහි 'කම්මං - කර්ම' සඳහා බලවත් කර්මයන් පමණක් ගත යුතු අතර, 'විපාකානං - විපාකයන්ට' සඳහා නාමවිපාක පමණක් ගතයුතු වේ. බලවත් වන්නා වූ කුසල අකුසල කර්ම හේතුවෙන් ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි අවස්ථාවේදී විපාක විඤ්ඤාණයන් පහළ වන අවස්ථාවේදී කර්මය ප්‍රත්‍යය වේ. සම්ප්‍රයුක්ත චෛතසිකයන් සහ විපාක විඤ්ඤාණය ප්‍රත්‍යයෝත්පන්න වේ ය යැයි අදහස් කෙරේ.

**උප්පාදිත උපසෙවිත ප්‍රත්‍යය විශේෂයෝ** - දක්වනා ලද මෙම ප්‍රත්‍යයන් අතරින් රාගාදිය, ශ්‍රද්ධාදිය ස්වකීය ආධ්‍යාත්මික සන්තානයෙහි පහළ කරවන්නා වූ උප්පාදිත ප්‍රත්‍යය විශේෂය යි. පුද්ගල, භෝජන, ඍතු, සේනාසන ස්වකීය සන්තානයෙන් බහිද්ධ වූ මුණගැසීම් සබඳතා පවත්වා ගැනීම්, ආහාර ගැනීම්, ආවරණය ලැබීම් ආදී නිශ්‍රය කිරීමට ලබන උපසෙවිත ප්‍රත්‍යය විශේෂය යි. මෙම අදහස අපේක්ෂා කරමින් අනුරුද්ධාචාර්යයන් වහන්සේ නාමරූප පරිච්ඡේදයේදී මෙසේ වදාළහ -

"රාගසද්ධාදයො ධම්මා - අජ්ඣත්තමනුවාසිතා
සත්තසඞ්ඛාරධම්මාච - බහිද්ධොපනිසෙවිතා"

මෙහි භෝජන, ඍතු, සේනාසනයෝ රූප සංස්කාර ධර්මයෝ වන අතර "සඞ්ඛාරධම්ම" යැයි කීහ. අන්‍යයන්ගේ රාග ශ්‍රද්ධාදී බහිද්ධොපනිසෙවිතා සඳහා ඇති ස්වරූපාර්ථයන්හි ඇතුලත් වේ. මෙම ගාථාව සාධක කොට දක්වමින් අභිධම්මත්ථ විභාවිනියේ " යථාරහං අජ්ඣත්තඤ්ච බහිද්ධාච" යන පාඨය රාගාදයො ආදී ප්‍රත්‍යය ධර්මයන් සමඟ සම්බන්ධ කරගනිමින් විකල්ප නයක්‍රමයකින් විවරණය කර ඇත. එහිදී ඒ ක්‍රමය සමඟ ඒ අදහස ගැලපුණේ නමුදු අභිධර්මාර්ථ සංග්‍රහ පාළියේ අදහසට නොගැලපේ.

**බහුධා හොති පකතූපනිස්සයො** - පකතූපනිස්සය ප්‍රත්‍යය චිත්ත චෛතසික රූප සහ පුද්ගල ඍතු භෝජන සේනාසන දක්වා පැතිර අතිශයින් පුළුල් ව පවතී. ඒ පිළිබඳ සිතිය යුතු යමක් ඇත. එනම් - මෙතරම් පුළුල් ව පැතිර පවතින පකතූපනිස්සය ප්‍රත්‍යය

චිත්ත චෛතසිකයන්ට පමණක් ප්‍රත්‍යය වෙමින් රූප ධර්මයන්ට කවර හේතුවක් නිසා ප්‍රත්‍ය නොවන්නේ ද යන්න යි. උල්දිය හේතුවෙන් බීජයන් පැල වී වෘක්ෂයන් වැඩෙද්දී උල්දිය වෘක්ෂයන්ට ප්‍රත්‍යය වීම, බෙහෙත් පානය කොට පැහැපත් රූපයක් ලැබීමේ දී ද බෙහෙත් රූපයන්ට ප්‍රත්‍ය වීම වැනි අවස්ථාවල දී පකතූපනිස්සය ප්‍රත්‍යය නොලැබෙන්නේ ද? යන පැනය මතු වේ.

පිළිතුර නම් - පකතූපනිස්සය යන්නෙහි 'පකත' පදයේ අර්ථය ගැඹුරින් විමසිය යුතුයි. "මනාව කරනා ලද" යන වචනයෙහි " ස්වකීය සන්තානයෙහි පහළ කරවන ලද, නිශ්‍රය කරවා ගන්නා ලද" යන උප්පාදිත, උපසෙවිත යන අර්ථ දෙක ම ලැබේ. ඒ පහළ කරවීම සහ නිශ්‍රය කරවාගැනීම, නාම ධර්මයන් සමඟ ම අදාළ වේ. රූප ධර්මයන්ට පහළ කරවාගැනීමට හෝ නිශ්‍රය කරවාගැනීමට පහළ කරවීමට නොහැකි වේ. (හුදු අචේතන අබ්‍යාපාර ධර්මයෝ ම වේ) එබැවින් "තමා කළ විට තමා ලබයි" යැයි කියන්නාක් මෙන් යම් නාම ධර්ම සන්තතියක් රාගශ්‍රද්ධා ආදිය උපදවනා ලද්දේ ද, පුද්ගල ආදිය ද නිශ්‍රය කරවා ගන්නා ලද්දේ ද ඒ නාම ධර්ම සන්තතිය ම තමා විසින් පහළ කරවනා ලද, නිශ්‍රය කරනා ලද රාගපුද්ගලාදීන්ගේ ඵලය භුක්ති විඳීමට අවසර ලබයි. එසේ නොකරනා ලද රූප ධර්මයෝ ඒ රාගපුද්ගල ආදියෙහි ඵලයන් ලැබීමට අවකාශ නොලබයි. එබැවින් පුළුල් ව පැතිර පවතින මෙම පකතූපනිස්සය ප්‍රත්‍යය රූප ධර්මයන් සඳහා අභිධර්ම ක්‍රමයෙන් ප්‍රත්‍යය වීමට අවකාශ නැත.

**සූත්‍රාන්තික පකතූපනිස්සය** - එසේ වුව ද "ඉමස්මිං - මෙම හේතුව, සති - ඇති කල්හි, ඉදං - මෙම ඵලය, හොති - පහළ වේ. ඉමස්මිං අසති ඉදං න හොති" යන සූත්‍රාන්තයේ පැමිණි පකතූපනිස්සය ශක්තියෙන් කලින් දැක්වූ රූප ධර්මයන්හි ප්‍රත්‍යය වීම දැක්වීමට අවකාශ ලැබේ. එබැවින් අභිධර්ම පකතූපනිස්සය නය, සූත්‍රාන්තික පකතූපනිස්සය නය යැයි බෙදු චිත්ත චෛතසික රූප ප්‍රඥප්තීහු චිත්ත චෛතසිකයකන්ට ප්‍රත්‍යය වීම දක්වන්නා වූ අභිධර්ම නය, සූත්‍රාන්තික නය යන නය ක්‍රම දෙකක් ලැබෙන අතර, රූපයන්ට ප්‍රත්‍යය වීම දක්වන තැනදී සූත්‍රාන්තික නය පමණක් ලැබේ. සූත්‍රාන්තික පකතූපනිස්සය නය ක්‍රමය අතිශයෙන් ම විස්තාරිත ය.